මහරගම නගර සභාව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මහරගම නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට මහරගම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයට අදාළව විමධ්‍යගත වැඩසටහන යටතේ රු. 10,339,053 ක් ද පළාත් සංවර්ධන ප්‍රදාන යටතේ රු. 81,158,566 ක් ද වශයෙන් වැඩ නිම කර තිබුණු කර්මාන්ත සඳහා රු. 91,497,619 ක් වූ මුළු ප්‍රාග්ධන පිරිවැය වර්ෂය තුළ ප්‍රාග්ධනිත කරනු වෙනුවට අලුත්වැඩියා හා නඩත්තු වියදම් ලෙස දක්වා තිබුණි.	කර්මාන්ත අංශයෙන් ද මෙය නඩත්තු හා අළුත්වැඩියා වියදමක් ලෙස ගෙවීමට ඉදිරිපත් කර ඇති බව.	ප්‍රාග්ධන හා පුනරාවර්ථන වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ආ)	වර්ෂය තුළ පොදු අරමුදලින් වැයකර නිම කර තිබුණු පාරවල්, පාලම් බෝක්කුවල ප්‍රාග්ධනිත පිරිවැය රු. 42,610,560 ක් වූ නමුත් ගිණුමට රු. 49,710,560 ක් ලෙස සටහන් කර තිබුණු හෙයින් පාරවල්, පාලම් හා බෝක්කු ගිණුම රු. 7,100,000 කින් වැඩිපුර දක්වා තිබුණි.	2025 වර්ෂයේ නිවැරදි කිරිමට කටයුතු කරන බව.	වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2024 දෙසැම්බර් 31 දිනට නගර සභාව විසින් ගිවිසුම්ගත වී වැඩ නිම නොවූ කර්මාන්තවල වටිනාකම රු. 37,082,254 ක් වුවද, ලෙජර ගිණුමෙහි රු. 79,652,831 ක් ලෙස රු. 42,570,577 ක් වැඩියෙන් දක්වා තිබුණි.	ගිවිසුම් ගත වුවත් සිදු නොකළ වැඩ පවතීද යන්න සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

(ඈ)	මහරගම දඹහේන පාර ග්‍රැම්බර් වත්ත ඉඩම පවරා ගැනීම වෙනුවෙන් නගර සභාව විසින් ගෙවා තිබුණු රු. 7,100,000 ක මුදල පාරවල්, බෝක්කු ගිණුමෙහි සටහන් කිරීම හේතුවෙන් ඉඩම් ගිණුම එම අගයෙන් අඩුවෙන් ද පාරවල්, බෝක්කු ගිණුම වැඩියෙන්ද දක්වා තිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	වත්කම් නිවැරදිව වර්ගීකරණය කර ගිණුම්ගත කළ යුතුය.
(ඉ)	මහරගම නගර සංවර්ධනය කිරීම සඳහා මහරගම පරණ පාරේ පිහිටි සියඹලා ගහවත්ත ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය විසින් අත්කර ගැනීමේ කටයුතු ආරම්භ කර තිබුණු අතර අත්කර ගැනීමේ පනතේ 17 වගන්තිය යටතේ ගෙවිය යුතු වන්දි මුදල ලෙස රු. 94,242,750 ක් ප්‍රකාශයට පත් කර තිබුණි. නගර සභාව විසින් නාගරික සංවර්ධන අධිකාරිය වෙත රු. 30,000,000 ක මුදලක් ගෙවා තිබුණු අතර, 2024 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබුණු ඉතිරි වන්දි මුදල වන රු. 64,242,750 ක් ගිණුම්ගත කර නොතිබුණි. තවද, නාවින්න ක්‍රිඩාංගනය සභාව වෙත පවරා ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු වන රු. 4,912,237 ක මුදල ද උපචිත ගෙවීම් යටතේ ගිණුම්ගත නොකිරීම නිසා රු. 69,154,987 කින් ජංගම වගකීම් අඩුවෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඊ)	නගර සභාව විසින් සූර්ය පැනල පද්ධති සවි කිරීම සඳහා රු. 13,094,564 ක් වැය කර ඇති නමුත් රු. 7,104,000 ක් පමණක් ප්‍රාග්ධනිත කර රු. 5,990,564 ක් ප්‍රාග්ධනිත නොකිරීම හේතුවෙන් සවිකිරීමේ ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(උ)	සමාලෝචිත වර්ෂයේ කසළ ඉවත් කිරීමේ ගාස්තුව ලෙස මුදලින් ලැබී තිබුණු රු. 8,586,481 ක් හා පෙර වර්ෂයට අදාළව එකතු කරගෙන තිබුණු රු. 1,752,323 ක ආදායම උපචිත පදනමට ගිණුම්ගත නොකර මුදල් පදනමට ගිණුම්ගත කිරීම හේතුවෙන් රු. 1,752,323 කින් සමාලෝචිත වර්ෂයේ සේවා ගාස්තු ආදායම වැඩියෙන් දක්වා තිබුණි.	2025 දී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

(ඍ)	සමාලෝචිත වර්ෂයේ පොදු අරමුදල, පළාත් සංවර්ධන ප්‍රදාන හා විමධ්‍යගත අරමුදල මූලාශ්‍රය කර වැඩ නිම කළ ව්‍යාපෘතිවල මුළු පිරිවැය රු. 370,105,680 ක් බව විගණනය පැහැදිලි කර ඉදිරිපත් කර තිබුණද, මූල්‍ය ප්‍රකාශනවල සවිකිරීම් යටතේ ප්‍රාග්ධනිත කර තිබුණු රු. 42,610,560 ක් හා අළුත්වැඩියා හා නඩත්තු ලෙස දක්වා තිබුණු රු. 309,653,666 ක් ද සමඟ ගිණුම්ගත කර තිබුණු කර්මාන්ත පිරිවැය රු. 352,264,226 ක් විය. ඒ අනුව ගිණුම්ගත නොවූ වර්ෂයේ වැඩ නිම කළ කර්මාන්තවල පිරිවැය රු. 17,841,454 ක් විය. එහෙත් රු.මිලියන 370 ක පිරිවැය සභාවට සොයාගත නොහැකි වූ බව ලේකම්වරයාගේ පිළිතුර විය.	රු.මිලියන 370 සොයා ගත් ආකාරය පැහැදිලි කරන්නේ නම් පිළිතුරක් ඉදිරිපත් කළ හැකි බව.	කරුණු සොයා බලා හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

1.6.2 නොසැසඳු පාලන ගිණුම්

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 06 කට අදාළ ශේෂයන් හා ඒවාට අදාළ උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු. 132,579,411 ක වෙනසක් විය.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	පොදු අරමුදලින් සිදු කරන ලද කර්මාන්ත 17 කට අදාළව සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ පැවති ගෙවිය යුතු ශේෂයන්හි රු. 4,351,720 ක වෙනසක් පැවතිණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු. 386,236,482 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම රු. 480,318,446 ක් විය.

2.2 මූල්‍ය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකු ජංගම ගිණුමේ සහ මුදල් පොතේ රු. 112,658,373 ක ශේෂයක් පැවතියද, එදිනෙදා වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් මුදලක් රඳවාගෙන ඉතිරි මුදල් කෙටි හෝ දිගු කාලීන ආයෝජනවල යොදවා ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබීමෙන් සභාවට ලබා ගත හැකිව තිබුණු ආයෝජන ආදායමක් අහිමි වී තිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	ඉතිරි මුදල් කෙටි හෝ දිගු කාලීන ආයෝජනවල යොදවා ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු කළ යුතුය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තුගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
		රු. '000	රු. '000	රු. '000	රු.'000	රු.'000	රු.'000	රු.'000	රු.'000
(i)	වරිපනම් හා බදු	251,200	261,667	261,936	248,229	247,433	260,095	244,475	243,218
(ii)	කුලී	27,961	26,780	29,050	10,455	25,260	27,461	23,076	15,337
(iii)	බලපත්‍ර ගාස්තු	11,600	13,768	13,564	633	6,600	12,327	12,327	-
(iv)	වෙනත් ආදායම්	6,280	9,030	9,030	-	6000	7,141	7,141	-
	එකතුව	297,041	311,245	313,580	259,317	285,293	307,024	287,019	258,555

2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) වරිපනම් හා බදු		
(i) සමාලෝචිත වර්ෂය සඳහා බිල් කරන ලද වරිපනම් ආදායම රු. 255,075,242 ක් විය. ඉන් 2024 දෙසැම්බර් 31 දිනට රු. 81,960,042 ක් හෙවත් බිල් කළ ආදායමෙන් සියයට තිස් දෙක (32%) ක් අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි.	2024 දෙසැම්බර් 31 දිනට තත්ත්වය දක්වා ඇති බව.	හිඟ වරිපනම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

(ii)	ඉකුත් වර්ෂය අවසානයට පැවති රු. 243,217,839 ක් වූ හිඟ වරිපනම් හා බදු ශේෂයෙන් 2024 දෙසැම්බර් 31 දිනට ආදායම් සම්බන්ධ ප්‍රගති වාර්තා අනුව රු. 78,638,324 ක් පමණක් අය කර ගෙන තිබුණු අතර රු. 164,579,515 ක් හෙවත් සියයට හැටහත (67%) ක් අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	හිඟ වරිපනම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	**කුලී**		
(i)	මූලා ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනට පැවති රු. 15,337,227 ක් වූ හිඟ කඩකුලී ආදායමෙන් රු. 9,201,942 ක් හෙවත් සියයට 60 ක් සමාලෝචිත වර්ෂය තුළ අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	හිඟ කඩකුලී අය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	2024 දෙසැම්බර් 31 දිනට කඩ කාමර 132 කින් රු. 10,390,155 ක හිඟයක් පැවතුණි. මෙම හිඟය තුළ වර්ෂ 01 ත් 03 ත් අතර කඩ කාමර 36 කින් රු. 2,952,379 ක් ද වර්ෂ 03 ත් 05 ත් අතර කඩ කාමර 24 කින් රු. 4,339,515 ක් ද, වර්ෂ 05 ට වැඩි කඩ කාමර 07 කින් රු. 1,109,821 ක් ද අය වීමට පැවතුණි. කඩ කුලී නොගෙවන වෙළඳසැල්වල අයිතිය ගිවිසුම් ප්‍රකාරව නැවත නගර සභාව වෙත ලබා ගෙන වෙනත් පාර්ශවයන්ට බදු දීමට කටයුතු නොකිරීම දීර්ඝ කාලයක සිට හිඟ ඉදිරියට එමින් පැවතීමට හේතු වී තිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	හිඟ කඩකුලී අය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(iii)	දීර්ඝ කාලයක සිට වසා දැමීම හේතුවෙන් මහරගම සතිපොළ කඩ අල්ලි 195 සිට 249 දක්වා කඩ 55 ක් බිල් කිරීම නතර කර හිඟ කඩ කුලිය වූ රු. 3,008,390 ක් කපා හැර තිබුණද, 2024 දෙසැම්බර් 31 දින වන විටත් එම කඩ කාමර ඵලදායී කාර්යයන් සඳහා යොදා ගෙන නොතිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	කඩ කාමර නැවත බදු දීමට කටයුතු කළ යුතු අතර ඵලදායි ලෙස යොදාගෙන ඇති කඩකාමරවල කුලී කපා හැරීම සම්බන්ධ විධිමත් පරීක්ෂණයක් කළ යුතුය.
(iv)	2024 දෙසැම්බර් 31 දිනට ගිවිසුම් කාලය අවසන්ව තිබුණු වෙළඳසැල් 72 ක අතර ගිවිසුම් අළුත් කර ගැනීමට හෝ වෙළඳ ස්ථාන සභාවට පවරාගෙන වෙනත් පාර්ශවයන්ට බදු දීමට කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	ගිවිසුම අළුත්කර ගෙන කුලී අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

(v)	ගිවිසුම් කාලය අවසන් වන දිනය සඳහන් කිරීමකින් තොරව බදුකරුවන් සමඟ ගිවිසුම්ගත වූ කඩ කාමර 71 ක් සභාව සතුව පැවතුණි. එකී කඩ කාමරවලින් 2024 දෙසැම්බර් 31 දිනට රු. 1,778,999 ක් අයකර ගැනීමට පැවති නමුත් එම කඩ කාමර සම්බන්ධව නීත්‍යානුකූලව කටයුතු කිරීමට හැකියාවක් පවතීද යන්න ගැටළු සහගත විය.	පිළිතුර ඉදිරිපත් කර නොමැත.	කඩකාමර 71 හි ගිවිසුම් විධිමත් කළ යුතු අතර, හිඟ අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)(i)	කසළ කළමනාකරණය සම්බන්ධව විධිමත් සැලැස්මක් සකස් කර නොතිබීම නිසා කරදියාන කසළ අංගනය වෙත කසළ බැහැර කිරීම වෙනුවෙන් රු. 88,417,693 ක් ද, කුලියට ලබාගත් වාහන සඳහා රු. 46,583,479 ක් සහ කසළ ප්‍රවාහනය කරනු ලබන සභාව සතු වාහන අළුත්වැඩියා කිරීම සඳහා වර්ෂය තුළ රු. 70,276,344 ක වියදමක්ද දරා තිබුණි. එනම් කසළ එක්රැස් කිරීම හා බැහැර කිරීම සඳහා පමණක් 2024 වර්ෂය තුළ වියදම රු. 205,277,516 ක් විය. නගර සභා ආඥා පනතේ 119 වගන්තිය ප්‍රකාරව කසළ සභාවේ දේපළක් විය යුතු බවට සඳහන් වුවද, 2024 වර්ෂයේදී සභාව විසින් එමඟින් ආදායම් ඉපයීමට හෝ වියදම් අවම කර ගැනීමට කටයුතු කර නොතිබීම නිසා කසළ බැහැර කිරීම නගර සභාවට විශාල වැය බරක් වී තිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	විධිමත් කසළ කළමනාකරණ සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීම තුළින් පිරිවැය අවම කර ගැනීමට කටයුතු කළ යුතුය.

(ii)	සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරික ස්ථාන තුළින් ජනනය වන කසළ නගර සභාව විසින් එක්රැස් කිරීමේ සේවාව වෙනුවෙන් 2024 ජුනි 30 දින වනවිට ව්‍යාපාරික ස්ථාන 146 කින් රු. 8,473,500 ක මුදලක් අයකරගෙන නොතිබුණි. ඉන් ව්‍යාපාරික ස්ථාන 10 කින් රු. 2,323,650 ක මුදලක් වර්ෂ 05 කට වැඩි කාලයක සිටද ආයතන 32 කින් රු. 2,910,000 ක මුදලක්ද වර්ෂ 03 ත් 05 ත් අතර කාලයක සිටද හිඟව පැවැතුණි. 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කසළ ගාස්තු පිළිබඳ කාල විශ්ලේෂණය විගණනය වෙත ඉදිරිපත් නොවීය.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	හිඟ කසළ ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ ව්‍යාපාරික කසළ ඉවත් කිරීමෙන් රු. 10,338,804 ක ආදායමක් ලබාගෙන තිබුණ ද සභාව විසින් කසළ බදු අය කර ගැනීම සඳහා අතුරු ව්‍යවස්ථාවක් පනවා ගෙන නොතිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	කසළ බදු අයකර ගැනීම සඳහා අතුරු ව්‍යවස්ථාවක් පනවා ගැනීමට කටයුතු කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වසර 05 පමණ කාලයක සිට පැවත එන උසාවි තැන්පතු, ඇප තැන්පතු හා NBT ගිණුම්වල එකතු ශේෂය වූ රු. 5,193,558 ක් සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	2024 දෙසැම්බර් 31 දිනට හිඟහිටි කර්මාන්ත ණයහිමි ශේෂය රු. 62,627,446 ක් වූ අතර, ඒ තුළ වර්ෂ 05 කට වඩා වැඩි කාලයක් නිරවුල් නොවී පවතින රු. 14,374,561 ක ශේෂයක් ද පැවැතුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	ගිණුම් විෂයයන් 10 කට අදාළ එකතුව රු. 692,225,104 ක් වූ උපලේඛන නිවැරදිව පවත්වාගෙන ගොස් නොතිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	උපලේඛන නිවැරදිව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.
(ඈ)	ඉඩම් සමඟ ඉදිරිපත් කර ඇති ගොඩනැගිලි ලේඛනය අනුව සමාලෝචිත වර්ෂය තුළ නගර සභාවට අයත් ඉඩම් ප්‍රත්‍යාගණනය කර එම අගයන් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතුය.

(ඉ)	කුඩා පරිමාණ දූෂකාරක කර්මාන්ත/ ක්‍රියාවලි සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ පළාත් පාලන ආයතන සඳහා මාර්ගෝපදේශයෙහි 3.3.(අ.), (ආ.) සහ (ඇ.) උපදෙස් ප්‍රකාරව ක්ෂේත්‍ර පරීක්ෂණ කමිටුවට ඇතුළත් කළ යුතු නිලධාරීන් පිළිබඳ උපදෙස් ලබා දී තිබුණ ද, ඒ අනුව ක්‍රියාකර නොතිබීම නිසා මාර්ගෝපදේශයේ 3.3.2 (අ.), (ආ.) සහ (ඇ.)උපදෙස් ප්‍රකාරව ක්ෂේත්‍ර කමිටු වාර්තාව පිළියෙල කිරීමේ කාර්යභාරය නිවැරදිව ඉටුවී තිබුණේද යන්න පිළිබඳව හා ක්ෂේත්‍ර පරීක්ෂණ කමිටු මඟින් අපේක්ෂිත අරමුණු ඉටුවී තිබුණේද යන්න විගණනයේදී ගැටළු සහගත විය.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතුය.
(ඊ)	සිරිපාපුර, සිගේරා පාර, මාදිවෙල කෝට්ටේ පාරේ නිවසක් අසල නගර සභාවට අයත් මාර්ගයේ ඉවුර බාදනය වීම හා මාදිවෙල ග්‍රාම නිලධාරි වසමේ 03 වන පටුමඟ, මාර්ගයේ කොටසක් ගිලා බැසීම හා ඒ ආශ්‍රිතව කණ්ඩිය අස්ථාවර වීම සම්බන්ධයෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ අංශය විසින් ඉදිරිපත් කර තිබුණු භූ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශිත දිර්ඝකාලීන නිර්දේශ ක්‍රියාත්මක වනතුරු කෙටි කාලීන නිර්දේශයන් ක්‍රියාත්මක කළ යුතු බවට සඳහන් කර තිබුණද එම කෙටි කාලීන නිර්දේශයන් සභාව විසින් ක්‍රියාත්මක කළ බවට විගණනයේදී තහවුරු නොවීය.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	අවදානම් කළමනාකරණය කිරීම සඳහා භූ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය.
(උ)	සිරිපාපුර හරහා මාදිවෙල තලපත්පිටිය සම්බන්ධ කරන මායිමේ කන්ද කඩා වැටීම නිසා උද්ගත වී ඇති අනාරක්ෂිත තත්ත්වය සම්බන්ධයෙන් කිසිඳු පියවරක් නොගැනීම පිළිබඳව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ අංශය විසින් ලබා දී ඇති වාර්තාවට අනුකූලව ක්‍රියාමාර්ග ගත යුතු වන බවට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නගර සභා ලේකම් වෙත ලිඛිතව දන්වා තිබුණද, 2024 ජුනි 25 දින සිරිපාපුර සංවර්ධන පදනම නැවත ඉල්ලීමක් කරන තුරු සභාව කඩිනම් පියවර ගෙන නොතිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	දීර්ඝ කාලීනව පස් කැපීම නිසා ඇතිවන අවදානම් අවම කර ගැනීමට නිසි පාලනයන් ඇති කළ යුතුය.

	දීර්ඝකාලීනව පස් කැපීම සම්බන්ධයෙන් නිසි පාලනයක් නොමැති වීම නිසා මේ තත්ත්වය උද්ගත වී ඇති බව විගණනයේදී ද අනාවරණය විය.		
(ඍ)	නගර සභා මූල්‍ය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු පිළිබඳ රීති අංක 42 ප්‍රකාරව නගර සභාව විසින් පවත්වාගෙන යන සෑම දේපළක්ම ඉන්වෙන්ට්‍රි ගත කර තැබිය යුතු අතර, සෑම මුදල් වර්ෂයක් අවසානයේ දේපළ සමීක්ෂණය සිදු කර පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පළාත් පාලන කොමසාරිස් ඒ සඳහා නියම කරන ආකෘතියට අනුකූලව සකස් කරන ලද ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුළත් කර යථාවත් කරමින් පවත්වාගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	රීති හා ගිණුම්කරණ ප්‍රමිතියට අනුව කටයුතු කළ යුතුය.

3.3 වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
නාවින්න ක්‍රීඩාංගනය නගර සභාව වෙත පවරා ගැනීම වෙනුවෙන් රු. 13,717,577 ක මුදලක් ගෙවා තිබූ අතර, නාගරික සංවර්ධන අධිකාරියට (ඉඩම් සංවර්ධන හා කළමනාකරණ) තවදුරටත් රු. 4,912,236 ක් ගෙවීමට ඇති බව දන්වා තිබුණි. නමුත් එම මුදල් ගෙවා වත්කම් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	පිළිතුර ඉදිරිපත් කර නොමැත.	ක්‍රීඩාංගනය පවරා ගැනීමට කටයුතු කළ යුතුය.

3.4 හඳුනාගත් පාඩු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
වර්ෂය තුළ LED විදුලි පහන් නිකුත් කිරීම් හා සවිකිරීම් සම්බන්ධව පරීක්ෂාවේදී ගබඩා බින්කාඩ් අනුව ගබඩාවෙන් නිකුත් කළ LED විදුලි පහන් සංඛ්‍යාවේ එකතුව 12,793 ක් වූ අතර විදුලි අංශයේ නඩත්තු කරන දෛනික විදුලි පහන් සවිකිරීම් සාරාංශ අනුව සවිකළ සංඛ්‍යාවේ එකතුව 12,002 ක් විය. ඒ අනුව විදුලි පහන් 791 ක අඩුවක් නිරීක්ෂණය වූ අතර එහි වටිනාකම රු. 1,601,775 ක් විය.	පිළිතුර ඉදිරිපත් කර නොමැත.	විදුලි පහන්වල ඌනතාවය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.5 ප්‍රසම්පාදනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
තාක්ෂණික ඇගයීම් කමිටුව photo cell 230W 10A (for 3 Bulbs) මිලදී ගැනීම සඳහා නිර්දේශ ලබා දීමේදී සමාන වගකීම් කාලයක් ලබා දෙමින් මිල ගණන් 02 ක් ඉදිරිපත් කර තිබූ ආයතන 02 ක් අතරින් අවම මිල නිර්දේශ නොකිරීමට හේතු ඉදිරිපත් කිරීමකින් තොරව රු. 1,650 ක් වූ ඉහල මිල ඉදිරිපත් කර තිබූ ආයතනයෙන් මිලදී ගැනීම නිර්දේශ කර තිබීමෙන් රු. 412,500 ක පාඩුවක් සිදු වී තිබුණි.	Photo cell 230W 10A (for 3 Bulbs) මිලදී ගැනීමේදී සාම්පල් පරීක්ෂා කර බලා එහි ප්‍රමිතිය අනුව මිලදී ගැනීමට තීරණය කර ඇති බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව මිලදී ගැනීම් කළ යුතුය.

3.6 කොන්ත්‍රාත් පාලනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2021 සැප්තැම්බර් 29 දිනැති 01/2021 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 2.3 ඡේදයට අනුව කමිටු විසින් සුදුසුකම් පරීක්ෂා කර සනාථ කිරීමෙන් අනතුරුව ප්‍රජා පාදක සංවිධාන වෙත ඉදිකිරීම් වැඩ කොන්ත්‍රාත් පැවරිය යුතු වුවත්, එකතු වටිනාකම රු. 62,420,000 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 18 ක් සම්බන්ධයෙන් එලෙස සුදුසුකම් පරීක්ෂා කර සනාථ කර තිබුණේද යන්න විගණනයේදී තහවුරු නොවීය.	පිළිතුර ඉදිරිපත් කර නොමැත.	ඉදිකිරීම් පැවරීමේදී චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය.
(ආ)	විර උයන වටරවුම් පාර සුදු බෝධිය අසල ආරක්ෂිත පැති බැම්ම ඉදිකිරීම සඳහා රු. 4,990,000 ක ඇස්තමේන්තුගත පිරිවැයකට ගොවි සංවිධානයක් සමඟ 2024 නොවැම්බර් 14 දින පොරොන්දු පත්‍රයකින් ගිවිසුම්ගත වී තිබුණද, පාර පළල් කිරීම සම්බන්ධව එම පොරොන්දු පත්‍රය තුළ ඇතුළත් වී නොතිබුණු අතර වැඩ විස්තරය හා රේට් ගණන් පිළිබඳ උපලේඛන හා වැඩ සැලසුම් සකස් කර විධිමත්ව අත්සන් තබා නොතිබුණි. එම පාරේ මැද කොටස පමණක් පළල් කිරීම තුලින් තදබදය අවම කර ගැනීමට හැකියාවක් පවතීද යන්න භෞතික පරීක්ෂාවේදී තහවුරු නොවූ අතර පැති බැම්ම ඉදිකිරීම සඳහා දරන ලද රු. 4,921,567 ක පිරිවැය මඟින් අපේක්ෂිත අරමුණු ඉටු වී තිබුණේද යන්න විගණනයේදී තහවුරු නොවීය.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	කොන්ත්‍රාත් පිරිනැමීමේදී ප්‍රමාණ පත්‍ර හා සැලසුම් සකස් කර විධිමත්ව ගිවිසුම්ගත වීමට කටයුතු කළ යුතු අතර, අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට හැකිවන පරිදි ප්‍රාග්ධන වැඩ සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය.

(ඇ)	හෝමාගම ගලවිලපුර 3 වන මාවත කාපට් අතුරා සංවර්ධනය කිරීම සඳහා ජොෂ්ය පුරවැසි සමිතියක් සමඟ රු. 4,990,000 ක වැඩ කොන්ත්‍රාත්තුවකට 2024 ජූලි 31 දින එළඹී තිබුණද, ගිවිසගත් පොරොන්දු පත්‍රයට අදාළ වැඩ විස්තරය එනම් සැලසුම්, සිතියම් වැඩ විස්තරය හා රේට් ගණන් පිළිබඳ උපලේඛන සකස් කර විධිමත්ව ගිවිසුම්ගත වී නොතිබුණි. මෙම කර්මාන්තය පිළිබඳ භෞතික පරීක්ෂාවේදී ගලවිලපුර 3 වන මාවතේ මීටර 182.8 ක් පමණක් කාපට් අතුරා තිබුණු අතර එයද මීටර් 136 හා 46.8 ක් වශයෙන් කොටස් දෙකකට සිදු කර තිබුණි. මීටර් 04 ක පමණ දිගින් යුත් ප්‍රමාණයක් කාපට් අතුරා නොතිබුණි. ගෙවීම් වාර්තාවේ අයිතම අංක 9 යටතේ සණ මීටර 154.5 ක් සඳහා ඒකකයකට රු. 5,237 බැගින් රු. 809,116.50 ක් ගෙවා තිබුණද, බස්නාහිර පළාත් ඉංජිනේරු කාර්යාංශය මඟින් නිකුත් කරන ලද මාර්ග ගාස්තු උපලේඛනයට අනුව එම කාර්යය සඳහා ගෙවිය හැකි මුදල සණ මීටරයට රු. 4,236 ක් වූයෙන් රු. 154,654.50 කින් ව්‍යාපෘති වියදම වැඩි වී තිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	විධිමත් පරිදි ගිවිසුම්ගත විමට කටයුතු කළ යුතු අතර, මාර්ග ගාස්තු උපලේඛනයට අනුව නියමිත කාර්යයට අදාළව නියමිත රේටයට ගෙවීමට වග බලාගත යුතුය.

(ඇ)	අමු ඇටමුල්ල පාර වෙල කොටසේ පැති බැම්ම ඉදිකිරීම සඳහා පිරිවැය රු. 4,950,000 ක් වූ ඇස්තමේන්තුවකට ප්‍රජා මණ්ඩලයක් සමඟ 2024 දෙසැම්බර් 12 දින ගිවිසුම්ගත වී තිබුණද, ගිවිසුම්ගත පොරොන්දු පත්‍රයට අනුව කර්මාන්තයට අදාළ ප්ලෑන්, සිතියම්, වැඩ විස්තරය හා රේට් ගණන් පිළිබඳ උපලේඛනය ආදියට අත්සන් තබා නොතිබුණි. කර්මාන්තය සඳහා ඇස්තමේන්තු දෙකක් සකස් කර තිබූ අතර, දෙවන ඇස්තමේන්තුවේ වැඩ විස්තරය වෙනස් වී තිබුණද, ඒ සඳහා අනුමැතිය ලබා ගෙන නොතිබුණි. දින 09 කින් නිමකර තිබූ මෙම කර්මාන්තය සඳහා 2024 දෙසැම්බර් 30 දින රු. 4,857,986 ක් ගෙවා තිබුණු අතර, කොන්ක්‍රීට් වැඩ ඉටු කිරීමෙන් පසු වැඩවල ප්‍රමිතිය තහවුරු කිරීම සඳහා අවම වශයෙන් දින 21 ක් ගත වුවද, ඊට පෙර ගෙවීම් නිර්දේශ කර තිබීම මතභේදාත්මක විය. තවද, දින 09 කින් නිම කර තිබුණු ඉදිකිරීම් කර්මාන්තය වෙනුවෙන් ගෙවීම් වාර්තාවේ අයිතම අංක 15 යටතේ (Tractor & Tailor (3Ton) (Bo-17)) දිනකට රු.12,821 ක් බැගින් දින 12 ක් සඳහා ගෙවීම් කර තිබීමෙන් රු. 38,463 ක් වැඩිපුර ගෙවා තිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	ඉදිකිරීම් කොන්ත්‍රාත් පැවරීමේදී නිවැරදිව ඇස්තමේන්තු සකස් කර අනුමැතිය ලබා ගැනිමටත්, විධිමත්ව ගිවිසුම්ගත වීමටත් කටයුතු කළ යුතු අතර, වැඩවල ප්‍රමිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. එමෙන්ම වැඩිපුර ගෙවීම් ආපසු අයකර ගත යුතුය.
(ඉ)	**වැඩ ආරම්භ නොකළ කර්මාන්ත**		
(i)	තලපත්පිටිය ගලේළිද අළුත්වැඩියා කිරීම සඳහා 2023 අගෝස්තු 17 දින සකස් කරන ලද රු. 1,750,000 ක් වූ පිරිවැය ඇස්තමේන්තුවකට ගොවි සංවිධානයක් සමඟ 2024 ජූලි 31 දින ගිවිසුමකට එළඹ තිබුණද, 2025 ජනවාරි 22 දින වන විටත් කර්මාන්තය ආරම්භ කර නොතිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	ගිවිසුම් ප්‍රකාරව කර්මාන්තය ඉටු කරවා ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	ගොඩිගමුව ආදාහනාගාරයේ තීන්ත ආලේප කිරීම හා අළුත්වැඩියා කිරීම සඳහා රු. 2,000,000 ක ඇස්තමේන්තුගත වැඩ වටිනාකමකට ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධානයක් සමඟ 2024 දෙසැම්බර් ගිවිසුම් ගත වී තිබූ අතර ගිවිසුම්ගත වූ දිනය පොරොන්දු පත්‍රයේ සඳහන් කර නොතිබුණි. ගිවිසුම්ගත වූ දින සිට මාස 02 ක් ඇතුළත කර්මාන්තය සම්පූර්ණ කොට භාරදිය යුතු වුවද, 2025 මාර්තු 18 දින වන විටත් අදාළ කර්මාන්තය ආරම්භ කර නොතිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	විධිමත් පරිදි ගිවිසුම්වලට එළඹීමටත් කර්මාන්තය නිසි පරිදි ඉටු කරවා ගැනිමටත් කටයුතු කළ යුතුය.

(ඊ)	මහරගම නීලම්මහර පාරේ කොහිල කොටුව භූමියෙහි දෙමහල් ප්‍රජා මණ්ඩල ගොඩනැගිල්ලේ පළමු මහල ඉදිකිරීම සඳහා රු. 4,000,000 ක ඇස්තමේන්තුවකට ප්‍රජා මණ්ඩලයක් සමඟ 2020 සැප්තැම්බර් 21 දින ගිවිසුම්ගත වී තිබූ නමුත් මෙම ඉදිකිරීම සම්බන්ධව මහජන විරෝධතා මතු වී තිබුණි. අනුමත මුදලින් පවත්නා පෙර පාසැල් ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම හා දෙමහල් ගොඩනැගිල්ලේ ස්ලැබ් නොයෙදූ කොටස ස්ලැබ් දමා ආවරණය කර විධිමත්ව සාදා දෙන ලෙස විරෝධතාකරුවන් ඉල්ලීම් කර තිබීම නිසා එම ගොඩනැගිල්ල සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙන් තත්ත්ව වාර්තාවක් ඉල්ලා රු. 23,328 ක මුදලක් ද සභාව විසින් ගෙවා තිබුණි. එම වාර්තාව රු. 45,057 ක මුදලක් ජාතික ගොඩනැගිලි පර්යේෂණ මණ්ඩලයට ගෙවා ලබා ගන්නා ලෙස 2022 ජනවාරි 24 දින කරන ලද දැනුම්දීමට සභාව ප්‍රතිචාර දක්වා නොතිබුණු අතර නැවත එම වාර්තාව රු. 56,037 ක් ගෙවා ලබා ගන්නා ලෙස දැන්වීමෙන් පසුව සභාව 2024 ජනවාරි 30 දින එම මුදල් ගෙවා තිබීමෙන් රු. 10,980 ක් වැඩිපුර ගෙවීමට සිදුව තිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	ජනතා අවශ්‍යතා හඳුනාගෙන නිසි ප්‍රමිතියට අනුව ඉදිකිරීම් සැලසුම් කළ යුතුය.